**සුවෙන් පෙරට**

**eඉගෙනුම් පියස**

**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

| | | වාරය - II |
|---|---|---|
| ශ්‍රේණිය : 6 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 11 පාඩම<br>කලා වැවට පින් දීලා පලයල්ලා |

## ➢ පාඩමේ අන්තර්ගතය කෙටියෙන්

- ශ්‍රී ලාංකික අපට ආවේණික වූ වාරි තාක්ෂණික අංගයක් ලෙස වැව හඳුන්වයි.
- වැව නිර්මාණය වූයේ ගොවිතැනට අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා ය.
- කලා වැව සම්බන්ධ තොරතුරු උපුටා ගෙන ඇත්තේ ආර්. එල්. බ්‍රෝහියර් මහතා විසින් රචනා කළ The Seeing Ceylon කෘතිය ‘බ්‍රෝහියර් දුටු ලංකාව’ නමින් අභය හේවාවසම් මහතා විසින් සිංහලයට නගන ලද කෘතිය තුළිනි.

### කලා වැව



- **කලා වැව පිළිබඳ සඳහන් ජනප්‍රවාදයන් මෙසේ ය.**

- ඈත අතීතයේ අනුරාධපුරයේ කඩවර නම් තැනැත්තෙක් සිටියේ ය.
- ඔහු තම බිරිඳගේ කෙනෙහිලිකම් නිසා ඇයගෙන් ඈත් වී මහ වන මැද ජීවත් වූයේ ය.
- ඉහත සිදු වීමෙන් වසර දොළහකට පසු රජ වාසලට මුව මස් සැපයූ මස් වැද්දා, මිනිසෙක් නගරයෙන් පැන ගොස් වනාන්තරයේ නිධානයක් රැකගෙන සිටින බව රජතුමාට හෙළි කරන ලදී.
- වනගත වී සිටින මිනිසා රජ මාළිගයට ගෙන්වා නිධානය පිළිබඳ කරුණු හෙළි කරන ලෙස අණකර සිටි අතර ඔහු සියලු තොරතුරු ප්‍රකාශ කළේ ය.
- ජලය එක් රැස් වී සැතපුම් ගණනාවක් ඈතට පැතිර තිබෙන ජලාශයක් ඇති බවත් වෙනත් නිධානයක් නැති බවත් එහි දී හෙළි විය.
- මේ පිළිබඳ ප්‍රීතියට පත් රජතුමා එම ස්ථානයේ  කලා වැව නිර්මාණය කළේ ය.
- කලා වැව ආරක්ෂාකර ගැනීමට  රජතුමා කඩවරට භාර කරන ලදී.
- දිනක් මහ වැස්සකට පසු වැවේ බැම්මෙන්  ජල කාන්දුවක් සිදු විය.
- එය නැවැත්වූයේ නැතිනම් වැව් බැම්මට හානිවන බව දත් කඩවර කළ යුතු වෙනත් කිසිවක් නොමැති නිසා තම සිරුර වතුර කාන්දුවන ස්ථානයට තබා තද කර ජල කාන්දුව නැවැත්වීමට කටයුතු කරන ලදී.
- මෙම ක්‍රියාවෙන් කඩවර මිය යන අතර මේ පින් මහිමය හේතුවෙන්  ම ඔහු කඩවර දෙවියන් ලෙස උපන්නේ යැ යි මිනිස්සු විශ්වාස කරති.

## කඩවර දේවාලය





- මෙය පැරණි වාන උඩ කඩවර දෙවියන් වෙනුවෙන් ඉදි කරන ලද දේවාලයයි.

## වැව් බැම්ම





- වැවේ ජල ධාරිතාව දරා ගෙන සිටීමට වැව් බැම්ම ශක්තිමත්ව තිබිය යුතුයි.

## වාන





- ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම වාන පිහිටා ඇත්තේ කලා වැවේ ය.
- කළු ගල කපා මෙය සාදා ඇත.
- මෙය අඩි 216ක් පළල අඩි 170ක් දිග ය.
- කලා වැවේ වාන එකල සිටි ශිල්පියාගේ ඉවසිලිවන්තකමත්, දක්ෂ බවත් පිළිබිඹු කරන පුදුමාකාර නිර්මාණයකි.

## රළපනාව





- දිය රැලි වැවේ ඇතුළු බිත්තියේ වැදීමෙන් වන හානිය වළක්වා ගැනීම සඳහා රළපනාව යොදා ඇත.
- දිය රැල්ලෙන් වැව් බැම්ම ආරක්ෂා වීම මේ තුළින් සිදුවේ.

### බිසෝ කොටුව



- 'ජලය බස්සවනවා' යන අර්ථය බිසෝ කොටුව යන වචනයෙහි ඇත.
- බිසෝ කොටුව මඟින් වැවේ ජලය පාලනය කිරීම හා මුළුමනින් ම නවතා දැමීම ද කළ හැකිය.
- මෙහි විශාල දොර පලු දැවෙන් නිමවා ඇත.

## ධාතුසේන රජතුමා කර වූ වාරිමාර්ග පද්ධතිය







- කලා වැව හා බලලු වැව එක්කර විශාල ජලාශයක් ඉදි කිරීම.
- එහි ජලය අඩි 40ක් පමණ පළල යෝධ ඇළ ඔස්සේ සැතපුම් 54ක් දුර ඇති අනුරාධපුරයට ගෙන යෑම.

- මෙය විශිෂ්ට නිර්මාණයකි. පළමු සැතපුම් දාහතේ දී එය සෙමෙන් ඇදී යන්නේ සැතපුමට අඟල් හයක් පමණ බෑවුමක් සමඟ ය.
- මීට අමතරව වර්ග සැතැපුම් 18ක වපසරියක් තුළ කුඩා ග්‍රාමීය වැව් 100ක් ඉදිකර අංග සම්පූර්ණ වාරි මාර්ග පද්ධතියක් බිහි කිරීම.

නුවර කලාවිය වැසියෝ අද ද කලා වැවට ගරු බුහුමන් දක්වන බව මෙම ජන කවියෙන් පිළිබිඹු වේ.

**“ කලා වැවෙන් දිය දෝතක් බීපල්ලා**
**කලා වැවට  පින් දීලා පලයල්ලා. ”**

- **පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. මෙම පාඩමට සම්බන්ධ මුල් ග්‍රන්ථය කුමක් ද?
2. එම ග්‍රන්ථය රචනා කළ කතුවරයා කවුද?
3. මෙම ග්‍රන්ථය සිංහලයට පරිවර්තනය කළ නම කුමක් ද? එහි පරිවර්තකයා කවුද?
4. රජතුමා කඩවර අත්අඩංගුවට ගත්තේ ඇයි?
5. කඩවර රජුට පැවසූ නිධානය කුමක් ද?
6. රජතුමා විසින් කඩවරට පැවරූ කාර්යය කුමක් ද?
7. කඩවර මිය ගියේ කෙසේ ද?
8. පැරැන්නෝ කඩවර දෙවියන් වෙනුවෙන් දේවාලයක් ඉදි කළේ කොතැනක ද?
9. වැවක ඇති රළපනාවෙන් සිදු වූ කාර්යය කුමක් ද?
10. ‘ කලා වැවට පින් දීලා පලයල්ලා ’ යන ජන කවි පදයෙන් අර්ථවත් වන්නේ කුමන අදහසක්ද?

# මාතෘකානුකූල රචනා ලිවීම

- මාතෘකානුකූල රචනා ලිවීමේ දී අවධාරණය කළ යුතු කරුණු.

- ➢ රචනාව ලිවීම සඳහා ප්‍රථමයෙන් තමන්ට වැඩි කරුණු ප්‍රමාණයක් ලිවිය හැකි මාතෘකාවක් තෝරා ගත යුතු ය.
- ➢ රචනය ලිවීමට පෙර ස්ථිර සැලැස්මක් සකස් කර ගත යුතු ය. එය රචනයේ සැකිල්ල ලෙස හැඳින් වේ.
- ➢ ගැළපෙන කරුණු, සාරවත් කරුණු, ගැඹුරු කරුණු, වඩාත් අදාළවන කරුණු පමණක් රචනාවට ඇතුළත් විය යුතු ය.
- ➢ ප්‍රධාන කරුණු යටතේ ඡේද වෙන් කර ගත යුතු ය.
- ➢ රචනය සංවිධානයේ දී ,
    - ප්‍රවේශය හෙවත් ආරම්භය
    - ශරීරය, මධ්‍යය හෙවත් ස්කන්ධය
    - අවසානය හෙවත් සමාප්තිය

  යන කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

❖ ප්‍රවේශය හෙවත් ආරම්භය

- විද්වත් මතයක්, ආප්තෝපදේශයක්, උද්ධෘත පාඨයක් වැනි කොටසකින් රසවත් ප්‍රවේශයක් ලබා ගැනීම තුළින් සාර්ථක රචනයක් ගොඩ නැගෙයි.

❖ ශරීරය, මධ්‍යය හෙවත් ස්කන්ධය

- මෙහි දී කරුණු සාරවත්, වැදගත් මෙන් ම ඒවා මාතෘකාවට අදාළ විය යුතු ය.
- ඡේද බෙදා තිබිය යුතු ය.
- රචනාවට කරුණු ප්‍රමාණවත් ව තිබිය යුතු ය.
- තමන්ගේ අදහස් ඉදිරිපත් කරමින් රචනාව ලිවීම සාර්ථක වේ.

❖ අවසානය හෙවත් සමාප්තිය

- රචනය අවසානයේ මුලින් දැක් වූ කරුණුවල සම්පිණ්ඩනයක් ඉදිරිපත් කළ යුතු ය.
- රචනය ආරම්භයේ මෙන් ම අවසානයේ දී රසවත් කරුණු හා වැදගත් කරුණු තිබිය යුතු ය.

- රචනයක් ලිවීමේ දී වැදගත් කරුණු කිහිපයකි. එනම්,
  - නාම පද, ක්‍රියා පද හා නිපාත පද වෙන් කර තිබිය යුතු ය.
  - විරාම ලක්ෂණ නිවැරදි ව යෙදිය යුතු ය.
  - නිවැරදි අක්ෂර වින්‍යාසය අනුගමනය කළ යුතු ය.
  - සම්මත වාක්‍ය රීති අනුගමනය කළ යුතු ය.

- පහත රචනා මාතෘකාවකට ගැළපෙන රචනා සැකිල්ල සාදා ඊට අනුව රචනාවක් ලියන්න.

  (1) වසංගතයෙන් ආරක්ෂා වෙමු.

  (2) නිවාඩුව අර්ථවත් ව ගත කරමු.

  (3) වනය අපට සම්පතකි.

ඩබ්.ජී සී.කේ.හඟුරන්කෙත මිය
ගුරු උපදේශිකා (සිංහල)